## 2018 මැයි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"ඔවුහු සියල්ලෝම ශුද්ධාත්මයාණන්ගෙන් පිරී දෙවියන් වහන්සේගේ
වචනය නිර්භීත ලෙස ප්‍රකාශ කළහ "**

(ක්‍රියා 4:31)

ජේසු ක්‍රිස්තු සමිඳාණන් කුරුසියේ ඇණ ගැසීමත් සමඟ ප්‍රවාමී ගෝළයා හැර පේදුරු තුමා ඇතුළු අනෙකුත් ශ්‍රාවකයින් සියළු දෙනාම ප්‍රදෙව්වරුන්ට බියෙන් පලා ගොස් සැඟවී සිටි බවත්, උත්ථාන වූ ජේසු සමිඳාණන් වහන්සේ ඔවුන්ට ප්‍රකාශ වීමත්, එදා සේනාකුළු ශාලාවේදී ගිනි දිවි ආකාරයෙන් වැඩම කළ ශුද්ධාත්ම ස්පර්ශයත් සමඟ ශ්‍රාවකයින්ගේ බිය පහවී ගොස් ඔවුන් නොබියව ධර්මශාලාවලදී ද, මගතොටේදී ද දේව වචනය ප්‍රකාශ කළ බවත්, සාක්ෂි දැරූ බවත් අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ මැනවින් සඳහන් කර ඇත. එබැවින් මෙවර ශුද්ධාත්ම මහ මංගල්‍යයත් සමඟම අප වෙත වැගිරෙන ශුද්ධාත්ම ගින්නත් සමඟම නොබියව දේව වචනය ප්‍රකාශ කරමින් සත්‍යයට සාක්ෂි දැරීමට එදින සහභාගි වන සියළුම ජනතාවට බලය ලැබේවා යි මේ මාසය පුරාවටම යාච්ඤා කරමු.

**"ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි"**

(ශු.ලූක් 11:28; 12:19)

පළමු සතිය: දිව්‍යමය කියවීම - ක්‍රියා 4:23-31

අයැදීමට විශේෂ යොමුව:

ශුද්ධාත්ම මහා මංගල්‍යය මුල් කරගෙන හෙටින් ඇරඹන පෙරමඟ සූදානම් නුවානවලට සහභාගි වීමට පිපාසයෙන් සිටින සියළුම පුබුදු ජනතාව ද, සෙසු අය ද, නුවන මෙහයවන වචනයේ සේවකයන්ව ද ශුද්ධාත්ම බලයෙන් පුරවමින් ශුද්ධාත්ම මහා මංගල්‍යයට සහභාගි වීමේදී වරප්‍රසාද රාශියක් ලබා ගැනීමටත්, දෙවියන් වහන්සේගේ වචනය නොබියව ප්‍රකාශ කිරීමට බලය දෙන ලෙසත් මොරගසා යාච්ඤා කරන්න. (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* ශුද්ධාත්ම මහා මංගල්‍යයට සංවිධාන කටයුතු කරන සියළු දෙනා වෙනුවෙන්.
* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව, සුසමථ එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - ක්‍රියා 3:11-16

අයැදීමට විශේෂ යොමුව :

ශුද්ධාත්ම මහා මංගල්‍යය මුල් කරගෙන ඊට සහභාගි වූ ජනතාවට ලැබුනු සෑම වරප්‍රසාදයක් වෙනුවෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන අතර, ඔවුන් වහන්සේගේ වචනය නොබියව ප්‍රකාශ කිරීමට දේව කැමැත්ත ඉටු කිරීමට ඊට සහභාගි වූ ජනතාවට ලැබෙන ලෙස යාච්ඤා කරමු.

(විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* ශුද්ධෝත්තම පියතුමා ඇතුළු රදගුරු, පූජක, ගිහි, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* රෝගී තත්ත්වයෙන් සිටින සියළු දෙනා වෙනුවෙන්.
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - ක්‍රියා 5:27-32

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

* අයැදීම් සේවාවේ යෙදෙන සියළුම දෙනා වෙනුවෙන්
* ප්‍රශංසාරාමයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ අඛණ්ඩ යාච්ඤාවේ යෙදෙන කුඩා කණ්ඩායම වෙනුවෙන් ද එම අඛණ්ඩ යැදුම් සේවාවට තව තවත් කැඳවීම ලැබෙන පිණිස.
* සුබැඳි සංඝය වෙනුවෙන්
* වෙනත් අයැදීම්

දැන්වීම් :

* පසුගිය දා කිතු දන පුබුදුව තුළ දෙවියන් වහන්සේගේ රාජ්‍යය සඳහා කැපවෙමින්, වැයවෙමින් නිරන්තර අයැදීමෙන් සිට ස්වර්ග රාජ්‍යයේ අඛණ්ඩ යැදුමට කැඳවාගත් හලාවත සාංඝිකයේ පම්බල ප්‍රශංසාගමේ බාර්බරා අම්මා සහ ගම්පහ සාංඝිකයේ වැලිවේරිය ප්‍රශංසාගමේ සිසී අම්මාගේ ආත්ම වෙනුවෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමු. යාච්ඤා කරමු.

* මාසයේ සෑම සිකුරාදාම යාච්ඤාවේ දිනයක් ලෙස ගත කරන්න.

"එවිට ප්‍රේරිතයෝ ඒ නාමය උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන
ප්‍රීතිවෙමින් මන්ත්‍රණ සභාවෙන් ඉවත්ව ගියහ "

(ක්‍රියා 5:41)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************